

## ගිම්හාන සිහිනයක්
**ප්‍රේමවංශ දසනායක**

ඉපනැල්ල මැලවිලා
කොබෙයියන් ඉගිලිලා
පුරන් කෙත සුසුම් ලයි
උඩ අහස දෙස බලා

කමත මත වැතිර ගත්
කුස නොපිරි ගව රැලක්
වමාරා විකා කත්
උලා කෑ තණ පිඩක්

සැඩ හිරුගෙ රැස් වලලු
දවාලයි හිස් මුදුන
ගිනි ගැනුන මහ පොළොව
පුලුස්සයි යටි පතුල

පිපාසෙන් පීඩිතව
කැකෑරෙන බොල් සුළඟ
කරකැවෙයි වියරුවෙන්
ධූලි පිඹ හතර වට

වැව් අමුණු තටාකය
ඉදිකෙරුන අත් නොමැත
උස් අහස කොත් සැදුන
මෙත් පහන් සිත් නොමැත

වැට නියර ලියැදු පෙළ
නිල් ගොයම රන් කරල
නෙලා දුන් අස්වැන්න
මතකයකි අතීතය

උදාවන හෙට දිනය
හඹා එන වලාකුල
සකල සම්පත් වැස්ස
බිම හලන බව කියන

උදානය පෙරටු කොට
මවාගත් සිහින තුල
අයා නෙත යොමා කන
බලා ඉමු දිවා රැය

## අප්‍රේල් මතකය ද වේලාසනින් අවදි වේ
විමල් කැටිපෙආරච්චි

**ගිනි පුළිඟු අරන් එන අඳුරේ**
**මිණි පළිඟු සොයන්නෙද මිතුරේ**
**තනි තනිව මියෙන්නට පමණ වරම් ලද**
**දිනිඳු නොදුටු මරු කතරේ**

**සුදු අකුණු ගැහෙන කළු අහසේ**
**තරු ලකුණු දකින්නෙද මිතුරේ**
**තටු බිඳුණු සියොත් ළඟ සිඳුණු අහස් ගඟ**
**ඉතුරු බිතුරු ගං පතුළේ**

**කොඩි ලෙලෙන සැලෙන විට සුළඟේ**
**වෙඩි වැදුණු කවක් ඇත මිතුරේ**
**පොඩි දෙයක් නුඹට පවසන්න ඇතත් මට**
**පිපුණු පිපුණු මල් පරවේ.**

## අද ඇසළ පෝදා නොවුනත්
**අතුල විජේවික්‍රම**

මන්ද තවමත්
පෙරළමින් පිටු
සූත්‍ර පිටකය
සසඳමින් අටුවාව

ජරාවට ගියනුන්
අපමණය
ගිලනුන් මළකඳන්
දසතමය
ශ්‍රමණයින් වඩී
මහමගද
නාටිකාවන්ද
නොඅඩුවම

අද ඇසළ පෝදා
නොවුනත්
මඟ කළුවරක් නැත
දරුවා තුරුළු කර ගෙන
ඇයද සුව නින්දක

## ගිලනුන්ට දානය
**ඩේසි ඒ. සිල්වා**

ලෙඩක් දුකක් හැදුනම කොයි කවුරු වුව
හඬක් ඇසෙනවා පින් මදි කරපු බව
ඉඩක් ලැබුණු විට ඒ අය කෙරෙහි දැව
අඩක් ඇහැකි ලෙස පිහිටික් සැමු නෙව

ඉනවට රෙදි කඩක් නොමැතිව ලද උපත
දනහට මතකයක් ඒ පිළිබඳව නැත
කනබොන අඳින පළඳින යස ඉසුරු මත
මොනයම් පෙර පිනක පලදීමක්ද ඇත

යායුතු නොවේ සොයමින් ලොව යස ඉසුරු
ආ ගමනක තියේ කිසියම් දෙය වැපුරු
දීමට ගිලනුන්ට නැති වේවා මසුරු
සලකනු ඔවුන්නට ඒ සතුටකි අපුරු

දියයුතු දෙයක් සුදුසුම අයෙකුට දෙන්න
විය යුතු නොවේ පසුබට සතුටින් දෙන්න
අය ඕනා තරම් නොහැකිව ඉල්ලන්න
ලය අභිමානයෙන් දිය හැකි දෙය දෙන්න

## මතක අසපුව අරා
**මංගලිකා ප්‍රනාන්දු**
ලිම්බෑක්

සංසාර සක්මනේ
අවසාන කඩඉමයි
අතීත ආවර්ජනා
හද දවයි වේදනා

කිරි පුසුඹ ඉව කරන්
දෙව් දුවගෙ වෙස් අරන්
මා තුරුලෙ නුඹ හිඳියි
මතක අසපුව අරා

නුඹෙ සිනා හඬ ඇසෙයි
මිහිරි ගී සර ලෙසින්
මිදුලෙ මල් සලිත වෙයි
නුඹ ඇවිත් දෝ සිතන්

දොර කවුළු හැර පියා
සුසුම් පා කර හරිමි
නුඹේ රුව යලි මැවී
හද සුවඳ මට දැනෙයි

ජීවිතේ අනියතයි
මඟ හැරුණමුත් අපව
දුවේ හමුවෙමු දිනක
මට යන්න අවසරයි

## පුරවැසි පෙමට
සුජාතා අබේසිංහ
ස්ප්‍රිං ෆීල්ඩ් ලේක්ස්
බ්‍රිස්බේන්

මගෙ ආදරේ තරම සාගරය පරදා
හිතාගන්නටත් නුඹට බැරි උනාද මන්දා
ආදරේට මං තවම කිරිකෝඩු හන්දා
මගේ ආදරේ නුඹට අරුමයක්ද මන්දා

ආදරේ තරමටම දුක ලැබුන හන්දා
රිදුන හිත හඬනවා නෙත කඳුළු රන්දා
මගේ හිත පැතුවේ නුඹ විතරක්ම හන්දා
කොහොම මං ජීවිතේ ගෙවන්න ද මන්දා

වැට කඩොලු කිසිදාක තිබුනෙ නැති හන්දා
පෙම් සිහින මාලිගා එකින් එක බැන්දා
ඒ සිහින සදාකල් අහිමි උන හින්දා
මගේ හිත මා එක්ක තනිවෙයිද මන්දා

නුඹේ හිත තව තැනක නැවතිලා හන්දා
මගෙ ආදරේ නුඹට සිහිවෙයිද මන්දා
මාව හැර දමා නුඹ යන්න ගිය හන්දා
මගේ ලොවට යළිත් හිරු පායයිද මන්දා




## ලෝ දහම එය තමා
**ආනන්ද ගුණතිලක**
හොපර්ස් ක්‍රොසිං

ජීවිතය තරඟයකි උපන්ද සිට (( කරන
මරණයයි තරඟ කරු අප ලඟම ලුහු බඳින
දුවන තුරු ඔහුට පෙරමුණ අරන් බැරි දිනන
එයයි ජීවිතය - අපි හිනැහිලා ගත කරන

එයා අප පරදවන ලෙසට දුව එයි හමා
හැකි තරම් වේගයෙන් දුවමු අපි හති දමා
නමුත් දවසක් ඒවි අපට විය හැකි පමා
දිනයි මරණය එවිට - ලෝ දහම එය තමා

තාත්තගෙ අම්මගේ ලොවම කළුවර කරන්
මාමලා නැන්දලා හැම දෙනම ගොළු කරන්
යහළු යෙහෙලියො පිරිස හඬවලා ඇතිතරන්
මනාෂා දියණි අද ගිහින් නෙත් දෙකපියන්

සිරිපාද කන්ද වී නොසෙල්වෙන සුල ඟකට
මහ වැලිය වගෙ ගලා නොනැවතී ඉදි රියට
දහම් පද හිතට ගෙන බුදු සමිඳු කිව් ලෙසට
හිතට සවි ගනු මැනවි පිවිසෙන්න ජය මඟට

දුක් වේදනා ලොවේ සැවොම ලඟ එමට ඇත
සිත සිතා හඬ හඬා ලත වීම සුදුසු නැත
ඉන්න පුළුවන් උනොත් දිරිය ගෙන දිවිය මත
අන්න ඒකයි සොයුර මිනිස් කම රකින සිත

බුදු වදන් නිරතුරුව සවන් මත වැටේවා
සොවින් බර ඔබගෙ හද ටිකෙන් ටිකනිවේවා
අකල් මරණයක් නම් කිසිවෙකුටනොවේවා
මනාෂා දියණියට නිවන් සැප ලැබේවා

## අලුත ගෙනා මනමාලි
**ශ්‍යාමා හේවාවිතාරන**

අපේ ගෙදරට අරන් ආපු
ලොකු පුටු සැටි එක
සාලෙ මැද්දෙ තිබ්බ ගමන්
වාඩි උනා ඇති පදනම

පැය ගානක් ගෙවිල ගියා
හැඩ බල බල ඉන්න
කොහෙදෝ සිට දුවන් ආව
පොඩි අක්ක සාලෙට

පරණ සාරි තුනක් අරන්
එතුමා පුටු ටික
ආයෙ දැක්කෙ ඒ පුටු ටික
අමුත්තො ආ දවසට

පාට සාරි පොරවාගෙන
ආඩම්බර කම තදකරගෙන
හොරෙන් හොරෙන් හිනැ-
හෙනවා
අපේ අළුත් පුටු සැටි එක

කා හටවත් වාඩි වෙන්න
දෙන්නේ නැහැ ඇය
පරිස්සම් කලා පුටු ටික
එක පොදියට හිරකර

ආසාවට ඉඳගන්නට
ගෙදර අයට තැන
වරම ලැබුනෙ පිට අයටයි
නෑගම් ආ විට

වසර ගනන් ගෙවිල ගියා
සාරිය උස්සා බැලුවා
පුටු ටික ඇත හැකිලිලාම
ඉඳගන්නට ඉඩ නොදීම

පොඩි අක්කත් නැතිව ගියා
පුටු සැටි එක දිරා ගියා
අදටත් අපි හිනැනෙවා
සිහි කර කර පුටු සැටි එක